


# සමාජ සම්මුති න්‍යාය සම්භාව්‍ය පැතිකඩ

මේ ග්‍රන්ථයෙන් දේශපාලන විද්‍යා න්‍යායයික ඉතිහාසයේ වැදගත් කොටසක් වන සමාජ සම්මුති න්‍යායල සම්භාව්‍ය දේශපාලන දාර්ශනිකයන් තිදෙනකු වන තෝමස් හොබ්ස්ල ජෝන් ලොක් සහ ෂාන් ෂාක් රූසෝ ගේ අදහස් ඇසුරෙන් විග්‍රහ කෙරේ. සැම විශ්ව විද්‍යාලයක ම පාහේ දේශපාලන විද්‍යාවට සම්බන්ධ වැදගත් උප විෂය දහරාවක් වශයෙන් දේශපාලන චින්තනය හෝ දේශපාලන න්‍යායයේ ඉතිහාස හෝ ඉගැන්වෙන අතර එම කොටස දේශපාලන විද්‍යා විශේෂ උපාධි පාඨමාලාවේ අනිවාර්ය අංශයක් බවට පත් ව තිබේ. එමෙන් ම එවැනි පාඨමාලාවන්හිල ඉතා වැදගත් න්‍යායයික අවධාරණයක් වන සමාජ සම්මුති න්‍යාය කෙරෙහි ලබා දෙන්නේ වැදගත් ස්ථානයකි. න්‍යායයික තලයේ දී සමාජ සම්මුතිවාදය යන අදහස ඉපැරණි ග්‍රීක චින්තනය තෙත් ඇතට විහිදී ගියත් එංගලන්ත ඉතිහාසයේ 17 සියවසෙහි නියෝජනය කල තෝමස් හොබස් සහ ජෝන් ලොක් මෙන් ම 18 වන සියවසෙහි ප්‍රංශයේ ප්‍රකට චින්තකයකු වූ ෂාන් ෂාක් රූසෝ සමාජ සම්මුතිවාදය සම්බන්ධයෙන් දැක්වූ අදහස් ඉතා වැදගත් වේ. ඒ අනුව මේ ග්‍රන්ථය තුළ මේ චින්තකයන් තිදෙනා සමාජ සම්මුතිය මූලික කොට ගෙන ඉදිරිපත් කළ දාර්ශනික ප්‍රවාද විස්තරාත්මක ව සාකච්ඡා කොට ඇත .